# බුද්ධ ධර්මය

# 07 ශ්‍රේණිය

*07 පාඩම*

## <u>ධම්ම පදයෙන් අපේ දිවියට</u>



සැකසුම-H.P.K.අචිනි ඉමල්කා සෝමවීර
ර/බල/කෝන්ගහමංකඩ විද්‍යාලය

ධම්ම පදය **සූත්‍ර පිටකයේ බුද්ධක නිකායට** අයත් වේ.

එය බෞද්ධයාගේ **අත්පොත** ලෙස හඳුන්වයි .

එහි බුද්ධ දේශනා **423** ඇතුළත් වේ .

ඒවා **වග්ග 26** කට සංග්‍රහ කොට ඇත .

# බුදු දහම

සිත් සනසයි

මිහිරියාව උපදවයි

සසර දුක් නිවයි

එහි ඇතුලත් ගිම්හානයෙහි පිපුණු මල් පොකුරක් වැනි බුද්ධ දේශනාවන් මෙසේය.

# යමක වග්ග 3 ගාථාව

- අක්කොච්ඡි මං අවධි මං
- අජිනි මං අහාසි මේ
- යේ තං උපනය්හන්ති
- වේරං තේසං න සම්මති

- අසවලා මට බැන්නේය,
- මට පහර දුන්නේය,
- මා පරාජය කළේය,
- මා සතු දේ පැහැර
- ගත්තේය,
- යනුවෙන් යම් අය නැවත නැවත
- සිතත් නම්, ඔවුන්ගේ වෛරය
- නොසන්සිදේ

# යමක වග්ග 4 ගාථාව

- අක්කොච්ඡි මං අවධි මං
- අජිනි මං අහාසි මේ
- යේ තං උපනය්හන්ති
- වේරං තේසූපසම්මති

- අසවලා මට බැන්නේය,
- මට පහර දුන්නේය,
- මා පරාජය කළේය,
- මා සතු දේ පැහැර
- ගත්තේය,
- යනුවෙන් යම් අය නැවත නැවත
- නොසිතත් නම්, ඔවුන්ගේ වෛරය
- සන්සිදේ.

මෙම ධම්මපද ගාථා දෙක දේශනා කලේ ***චූල්ල තිස්ස*** තෙරුන් අරහයාය.

**මේ හිමියෝ ,**

- ❖ **උඩගුය.**
- ❖ **තමා පැවිද්දෙන් ලාබාලසේ නොසිතය .**
- ❖ **වැඩිමහලු භික්ෂූන්ට ගරු නොකළහ.**
- ❖ **තම අඩු පාඩු සකස් කර ගැනීමට උත්සාහ නොකලහ .**

දිනක් තරුණ භික්ෂු නමක් මේ හිමියන්ගේ වැරදි ගති පැවතුම් පෙන්වා දෙමින් අවවාද කළහ.
එයින් ථුල්ල තිස්ස හිමි කෝප වී බුදුරජාණන් වහන්සේට පැමිණිලි කළහ .
බුදුරජාණන් වහන්සේද මෙම භික්ෂුවට අවවාද කළ නමුත් එය නොපිළිගත්හ .
වෛරී සිතුවිලි වලින් යුක්ත විය .
මේ නිසා මේ භික්ෂුව අරභයා ඉහත ගාථා දේශනා කොට ඇත .

ඉහත ගාථා දෙකෙන් අපට ගත හැකි ආදර්ශ-

- ඉවසීමෙන් කටයුතු කිරීම.
- මෛත්‍රීය පැතිරවීම.
- හොඳ වචන කතා කිරීම.
- අවවාද පිළිගැනීම.



බුදු දහම

**අනුසෝතගාමී** නොවේ

එනම් යටි ගං බලා යෑමට මග නොපෙන්වයි

බුදු දහම

**පටිසෝතගාමී** වේ

එනම් උඩු ගං බලා යෑමට මග පෙන්වයි.

# එම නිසා බෞද්ධ දරුවන් වන අප යා යුත්තේ

- වෛරයෙන් **අවෛරයටය**
- ක්‍රෝධයෙන් **අක්‍රෝධයටය**

මෙයින් නිවුනු ශාන්ත සිත් ඇති දරුවන් බවට පත් වන අතර අනුන්ද ප්‍රිය කරන දරුවන්වේ.

